# ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය

## රජත ජයන්තිය සමරයි



සන්නස් ලියනගේ



පසුගියදා කීස්බොරෝ හී ධම්මසරණ විහාරස්ථානයේදී සර්ව රාත්‍රිසක පිරිත් දේශනාවක් පවත්වනු ලැබුවා. මෙල්බර්න් පුරවරයේ සියලූම විහාරස්ථානවාසී ගරු කටයුතු ස්වාමින්වහන්සේලාගේ සහභාගිත්වයෙන් පවත්වන ලද මෙම පිරිත් දෙසුමට සහභාගිවී පැයක් දෙකක් පිරිත් ශ්‍රවණය කරන බලාපොරොත්තුවෙන් මා ඊට සහභාගී වුවද රැය පහන් වී යනතුරුම එහී රැඳී සිටියේ නොදැනුවත්වමය. එය මොන තරම් අපුරුවට සිදුවූ ආගමික උත්සවයක්ද? එසේම කොතරම් සංවිධානාත්මකව සිදුවූ උත්සවයක්ද? අතපසුවීමකින් හෝ සිදුවූ සුළු හෝ අඩුපාඩුවක් දැක ගැනීමට නොහැකිවූ එම පිරිත් දේශනාව සංවිධානය කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයීය ආදී ශිෂ්‍ය සංගමය විසිනි. ඔවුන්ගේ ආදී ශිෂ්‍ය සංගමයට 25වසක් පිරීම නිමිති කොට ගෙන එය පැවැත්වූ බව දැන ගන්නට ලැබුනා.

ධර්ම ශාලාව මැද ඉදිකර තිබු ඉතා අලංකාර පිරිත් මණ්ඩපය ඔවුන්ගේ ශිල්පිය ඥානය හා සාමුහික බව එක් කරමින් ප්‍රතිභාව විදහා පෑ කැඩපතක් ලෙස මා ඉදිරියේ දිස්වූ බව සඳහන් කරන්නට කැමැත්තෙමි. ශ්‍රී ලංකාවේදී හෝ මෙතරම් කලාත්මකව පරිපුර්ණ වූ පිරිත් මණ්ඩපයක් නිසැකයෙන්ම මා දැක නොතිබූ බව සඳහන් කළ යුතුය. පිරිත් ශ්‍රවණය කරන බැතිමතුන්ගේ දැහැන බිඳ නොවැටී පිරිත් ශ්‍රවණය කිරීමට එම මණ්ඩපය අනිවාර්යයෙන්ම පිටුවහලක් වන ලෙස නිමා කොට තිබුණි. දහස් ගණනක් පිරිත් ශ්‍රවකයන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වූ මෙම පිරිත් දෙසුමට පැමිණි සැමට කිසි අපහසුතාවකින් තොරව තම රථ ගාල් කිරීමට විධිවිධාන යොදා තිබුනේ පිරිත් පින්කමට යන්තමින් හෝ බාධාවක් නොවන අයුරිනි. එමෙන්ම විහාරස්ථානය පිටුපස මායිමේ ඉදිකළ තාවකාලික ශාලාවක පිරිත් ශ්‍රවකයන්ට රාත්‍රී ආහා රය පිළියෙළ කර තිබුනේ මා කලින් කිවූ පරිදිම සුළු හෝ අතපසුවීමක් සොයා ගත නොහැකි ලෙසය.



මා මේ වචනවලට පෙරලීමට වෙහෙසවන්නේ අපි කොතෙකුත් දැක ඇති ඔවුන්ගේ ශක්තිය හා සාර්ථකත්වයයි. වසර 25ක් ක්‍රියාකාරී ලෙස තබා නාමිකව හෝ මෙවැනි සමිතියක් පවත්වාගෙන යාම ඉතා අපහසු කාර්යයක් බව ඔබත් මාත් හොඳින් දන්නා කරුණකි. එනිසාම දශක දෙක හමාරක කාලයක් අප ජන සමාජය තුල ක්‍රිනයාකාරී ලෙස විශාල මෙහෙවරක් ඉටු කල ඔවුන්ගෙන් කෙනෙකුට අප පුවත්පත් සමග සාකච්ඡාවකට සහභාගිවන ලෙස මම ආරාධනා කළෙමි. මම ඒ සඳහා සංගමයේ වර්තමාන සභාපති පියල් මලවරආරච්චි මහතාට දුරකතනයෙන් කතා කලෙමි. ඔහුගේ ක්ෂණික පිළිතුර ඉතා ආදර්ශවත් එකකි.

"අඩබෙරවලට වඩා ක්‍රියාවෙන් යමක් කරන්නයි අප වෙහෙසෙන්නේ. අවුරුදු 25ක් සමරණ මොහොත නිසා මම සංගමයේ නිලධාරින් සමග කතා කර ඔබත් සමග සම්බන්ධ වෙන්නම්"

ඔහු සමග අප කළ සාකච්ඡාවයි මේ

**ඔබ සංගමයේ ආරම්භය ගැන යමක් සඳහන් කරන්න.**

80 දශකයේ මැද භාගයේදී ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය ඕස්ට්‍රේලියානු රජයේ විශේෂඥයන් විසින් පරික්ෂා කරනු ලැබ ඕස්ට්‍රේලියාවේ කාර්මික සේවයට එක්වීමට අවශ්‍ය සියලූම සුදුසුකම් ඇති බවට අනුමැතියක් ලබා දුන්නා. ඉන් පසු 90 දශකයේ මුල භාගයේ අපේ ආයතනය හා ඊට අනුබද්ධ ආයතන වල සාමාජිකයන් ඕස්ට්‍රේලියාවට විශාල වශයෙන් සංක්‍රමණය වන්නට පටන් ගත්තා. ශ්‍රී ලංකාවෙන් පැමිණ නුහුරු ජන සමාජයක් තුල හුදකලා වූ අපට සාමූහිකව නැගී සිටීමේ අවශ්‍යතාව තදින්ම දැනෙන්නට පටන් ගත් නිසාම 1991 දී අප සංගමය බිහි වූ බව කිව හැකිය.

එදා අපට ප්‍රධාන වශයෙන් අරමුණු තුනක් තිබුණා. එනම්, සාමාජිකයන් හා ඔවුනගේ පවුල් වල සුභසාධනය, අප නිවහන කර ගත් ඕස්ට්‍රේලියානු ජන සමාජය තුල යම් මෙහෙවරක් කිරීම, ඒ වගේම අපිට නොමිලේම සිප් සතර ලබා දී ලෝකය දකින්න දෑත් සවිමත් කළ ලක් මවට හැකි අයුරින් උපකාර කිරීම.



**සාමාජික සුභ සාධනය වෙනුවෙන් ඔබගේ මෙහෙවර කෙබඳු එකක්ද ?**

සාමාජිකයන්ගේ දෙමව්පියන් හෝ පවුලේ උදවියගේ වියෝවකදී මරණාධාර ක්‍රමයක් මගින් සහන ලබා දීමට කටයුතු කර තිබෙනවා.

එමෙන්ම සාමාජිකයන්ගේ හා ඔවුන්ගේ දරුවන්ගේ කලා කුසලතා වර්ධනය කර ගැනීමට ගිම්හාන රංගන නම් වූ ප්‍රසංගයක් නොකඩවා පවත්වාගෙන යාම. තරුණ දරුවන් වෙනුවෙන්ම වෙන්වූ යව්වන රංගන ප්‍රසංගය පවත්වා ගෙන යාම.

විශේෂයෙන්ම අපේ සංස්කෘතික

